# හොඳ සිංහල



## වි ක ධර්මබන්ධු

දුහුනන් ගේ (ආධුනිකයන් ගේ) ගද්‍ය පද්‍ය රචනා කියවන විට දක්නට ලැබෙන සුලභ දෝෂයක් අද හොඳ සිංහල පාඩමින් සාකච්ඡා කරමු. මෙය ඉතා සැලකිල්ලෙන් කියවා තේරුම් ගෙන සිතේ තැන්පත් කර ගන්නේ මැනවි.

මම/මා - අපි/අප යන නාම පද වැකි වල යෙදීමේදී උක්ත රූපය හා අනුක්ත රූපය මාරු වීම ඒ දෝෂයයි. ගී සින්දු වැනි පı රචනයකදී වුව ද උක්තානුක්ත දොෂය දෝෂයක් ම බව මතක තබා ගන්න. තාලය රැකීම සඳහා හෝ එළි වැට රැකීම සඳහා වචන විකෘති කිරීම හෝ උක්තානුක්ත රීතිය නොසලකා හැරීම රචනයේ අගය අඩු වීමට හේතු වේ. එය තමන්ගේ දුබලකම ප්‍රදර්ශණය කිරීමකි. දුහුනන්ට පı ප්‍රබන්ධ සඳහා මහ පියුම් විරිත ඉතා සුදුසු යයි සිතමි.

ගහයෝ නම් අඹර (9) දොවියෝ ය උෟ සුර-පුර (11)
නොගනිති අන් අහර (9) උදක් අම රස මිසක් මනහර (14)

දොර දොර මිනී බෙර (9) ගෙය් ගෙය් හඬය බියකර (11)
පිල පිල අඳින මර (9) දුගී ගිලනුන් ගෙන් නැතිවසර (14)

ගී විරිත් පිළිබඳව පසුව උගනිමු. එතෙක් මේ විරිතට අනුව ගී බපඳා පුහුණු වන්න.

කවර වැකියක වුවත් උත්තානුක්ත යෝගය නිවැරදි දැයි දැන ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රමය උපයෝගී කර ගත හැකි ය.

පළමුවෙන් ම වාක්‍යයේ ආඛ්‍යාතය හෙවත් අවසාන ක්‍රියාව සොයා ගන්න. සාමාන්‍යයෙන් වාක්‍යයක් අවසානයේ ආඛ්‍යාතය දක්නට ලැබේ. එහෙත් වාක්‍යයක මුල මැද අග යන කවර තැනක වුව ද ආඛ්‍යාතය තිබිය හැකි ය.

හරා අරා කෙලෙස් කුළු - සිදත් සඟරාව. (ඊශ්වරයා හිඳී කයිලාස කූඨයේ) මෙහි අවසාන ක්‍රියාව යෙදී ඇත්තේ වැකියේ මැද ය. ඊහි ආඛ්‍යාතය යෙදී ඇත්තේ වැකියේ මුල ය. එහෙයින් මුල මැද අග යන කවර තැනක තිබුණත් වාන්‍යයක ආඛ්‍යාතය පළමුවෙන් ම සොයා ගත යුතු ය.

අනතුරුව එහි කර්තෘ හෙවත් ඒ ක්‍රියාව කරන්නා සොයා ගත යුතු ය. මුල් වැකියේ

කවරෙක් අරා (හිඳී) ද?

හරා (ඉසුරු) අරා (හිඳී)

දෙවැන්නේ කවරෙක් නටත් ද?
අයෙක් නටත්.

මෙහිදී හරා ඒක වචනයට ඒක වචන ආඛ්‍යාතයකුත් අයෙක් යන නිත්‍ය බහු වචනයට බහු වචන ආඛ්‍යාගයකුත් ඇති බව ඔබට පෙනේ. ඇතැම් විට උක්තය අධ්‍යාහාරයෙන් සොයා ගත යුතු ය.

බලව දැන් මා තට කරන දේ (මෙහි උක්තය තෝ ය)
කියව බුදු ගුණ අලංකාරය (උක්තය මම)

යන වැකි දෙකේ උක්තය අධ්‍යාහාරයෙන් ගත යුතු ය.

මගේ යන අදහස දුටු කෙණෙහි වැකිය මි යන්නෙන් අවසන් කිරීමට සමහරු පෙළඹෙති.

ලියුම මට ලැබුණෙමි.
මා භූතයෙක් දැක ඇත්තෙමි.

යන වැකි එබඳුය. ලැබුණෙමි යන ක්‍රියාව ලැබිණි - ලැබිණේ ය යනුවෙන් වෙනස් විය යුතුය. එවිට උක්තය වන්නේ ලියුම යි. ඒසේ නැතහොත් ලදිමි - ලැබීමි - ලැබුවෙමි යනුවෙන් ක්‍රියාව වෙනස් කළ යුතුය. එවිට ලියුම ලැබූ තැනැත්තා වන්නේ මම ය. ඒ නිසා මා යන්න මම යනුවෙන් වෙනස් විය යුතුය. මා අනුක්ත රූපය බව ඔබ දනිතැයි සිතමි.

දැක ඇත්තෙමි යන්න ඉංගිරිසියේ Present Perfect ක්‍රියාවක් යැයි සිතමි. දැක ඇත්තේ මම යි. ඒ නිසා එහි ද මා යන්න මම යනුවෙන් වෙනස් විය යුතු ය. මතක තබා ගත යුත්ත නම් මම - අපි උක්ත රූපය බවත් මා - අප අනුක්ත රූපය බවත් ය. අද ඔබට ඉතා පහසු අභ්‍යාසයකින් ඔබ ලබා ගත් දැනුම තහවුරු කිරීමට අදහස් ක්රමි.

මේ වැකි හරි ද වැරදිද? මෙහි ඇති නිවැරදි වැකි ඒ ලෙසම ලියන්න. වැරදි වැකි නිවැරදි කොට ලියන්න.
1 මට කාරයක් ඇත්තෙමි
2 අප ජපන් බස නොදන්නෙමු.
3 අපි සිංහලයෝ ය.
4 මා බෞද්ධයෙක්මි.
5 මම විභාගයෙන් සමත්.
උත්තර මීළඟ කලාපයේ.

## සුභාෂිතයෙන් 3

සියපත් සැදූ බඹ සුර නර උරග මත
සැරියුත් මහ මුගලන් පිලිවෙලිනි පත
පිලිවෙත් සරු මහ සඟනට මුනිඳු සුත
මුඳුනත් දී බැතියෙන් නමඳිමි සතත

මෙහි මුල් පදයේ මාත්‍රා 18 ක් ඇතත් අනෙක් පද වල ඇත්තෙ මාත්‍රා 17 කි. එහෙයින් කවිය ගැයීමේ දී සැරියුත් මහා මුගලන්, පිලිවෙත් සරු මහා සඟනට , මුදුනත් දි දී බැතියෙන් යනුවෙන් මාත්‍රාවක් එක් කර ගැයීම සුදුසු ය.

(සියපත් - බඹ සුර නර උරත - මත - සැදූ - සැරියුත් මහ මුගලන් පිලිවෙලිනි - පත පිලිවෙත් සරු - මුනිඳු සුත - මහ සඟනට - මුදුන් අත් දී - බැතියෙන් - සතත - නමඳිමි )

සියපත් - තම පාදය නැමති සියපතින්/පියුමෙන්
බඹ සුර නර උරග - බ්‍රහ්ම දිව්‍ය මනුෂ්‍ය නාග යන මොවින්ගේ
මත - මුදුනේ
සැදූ - පිහිටවූ
සැරියුත් මහ මුගලන් පිලිවෙලිනි - සැරියුත් මහ මුගලන් පරම්පරාවෙන්
පත - පැවත ආ
පිලිවෙත් සරු - ප්‍රතිපත්තියෙන් සාර වූ
මුනිඳු සුත - බුද්ධ පුත්‍ර වූ
මහ සඟනට - මහා සංඝයාට
මුදුන් අත් දී - අත් හිස මුදුනේ තබා
බැතියෙන් - භක්තියෙන්
සතත - හැම විට
නමඳිමි - වඳිමි

සීයාහ්.. ප්‍රභාකරන්ට වෙඩි වදින්නෑලු නේහ්..
ඇයි ඒ? කාගෙද කෙප්පයක්..
නෑහ්.. දාස් වාරයක් ජප කරපු යන්තරයක් සුරේක දාලා ඉනේ බැඳ ගෙන ලු ඉන්නෙ. වස් කවි කියලාවත්, කොඩිවින කරලාවත් ඒකා මරන්න බැරී ලු..
කව්ද පුතාට ඕක කිව්වෙ..?
දහම් පාසලේ පාඩි සාදු..
ආ.. එහෙනම් බොරුවක් වෙන්නත් බැහ්...

විකා

